# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.13 පැය 2115 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/727/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මිනුවන්ගොඩ පොලිස් වසම

2025.04.13 වන අද දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ දෙවලපොල ප්‍රදේශයේදී දෙපාශර්වක් අතර ඇති වූ ආරවුලක් හේතුවෙන් එක් පුද්ගලයෙකු විසින් අනෙක් පුද්ගලයාට තියුණු ආයුධයකින් පහරදී මිනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මිනුවන්ගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක් වූ ගණෙහිමුල්ල, දෙවලපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවසේ ඇති කරනු ලබන සුනඛයෙකු සැකකරුගේ නිවසට යාම හේතුවෙන් ඇති වූ ආරවුලක් මත මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. සැකකරු ඝාතනයෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් ඇත.

මෘතශරීරය මිනුවන්ගොඩ රෝහලේ මෘතශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට -පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකය.

2025.04.13 වන අද දින උදෑසන කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගුවන්තොටුපල පැමිණීමේ පයර්න්තයේදී වැටලීමක් සිදු කර නීති විරෝධී ලෙස දුම්වැටි 25000 ක් විදේශ රටක සිට මෙරටට ගුවන් මගින් රැගෙන එන ලද පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - කිලිනොච්චිය පොලිස් වසම.

2025.04.13 වන අද දින උදෑසන කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ කුමරකුලම් ප්‍රදේශයේ මුරුගන් කෝවිල අසල ඇලෙහි පුද්ගලයෙකු මියගොස් ඇති බවට කිලිනොච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ පරන්තන්, කිලිනොච්චි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කෝවිල අසල ඇලට ලිස්සා ඇද වැටීමෙන් දියේ ගිලී මියගොස් ඇති බවට මූලික විමශර්නයේදී අනාවරණය වී ඇති අතර මෘතශරීරය කිලිනොච්චි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිලිනොච්චි පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන් වීම - වැලිකන්ද පොලිස් වසම.

2025.04.13 වන අද දින දහවල් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ කටුවන්විල ප්‍රදේශයේ මල්විල ඉෂඩ් ඩී ඇලෙහි අතුරු ඇල මාගර්යක දිය නාමින් සිටියදී පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 66 ක් වූ මල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එම පුද්ගලයා සොයා මෙහෙයුම් තවදුරටත් සිදු කරනු ලබන අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - ඌරගස්මංහන්දිය පොලිස් වසම.

2025.04.13 වන අද දින දහවල් කාලයේදී ඌරගස්මංහන්දිය පොලිස් වසමේ යටගල ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු මියගොස් ඇති බවට ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ යටගල, ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පමණක් නිවසේ පදිංචිව සිට ඇති අතර මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 06. හදිසි මරණයක් - අරලගංවිල පොලිස් වසම.

2025.04.13 වන දින උදෑසන කාලයේ අරලගංවිල පොලිස් වසමේ මැදගම ප්‍රදේශයේ කුඹුරු යායක පුද්ගලයෙකු ට්‍රැක්ටරයකට යට වී මියගොස් ඇති බවට අරලගංවිල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ මැදගම, දේවගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු මැදගම කුඹුරු යායේ කුඹුරක ට්‍රැක්ටරයකින් සී සාමින් සිටියදී එම ට්‍රැක්ටරයෙන් ඇද වැටී එම ට්‍රැක්ටරයටම යට වීමෙන් මෙම මරණය සිදුව ඇති බවට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණ වී ඇත.

මෘත ශරිරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මහව පොලිස් වසම.

2025.04.13 වන අද දින උදෑසන කාලයේ මහව පොලිස් වසමේ අනුරාධපුර පාදෙණිය මාගර්යේ කැත්තපහුව ප්‍රදේශයේදී පාදෙණිය දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ වෑන් රථයක් රියදුරුට රථය පාලනය කරගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන මාගර්ය අයිනේ තිබූ කුඹුක් ගසක වෑන් රථයේ ඉදිරිපස ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු, පිරිමි පුද්ගලයෙකු හා කාන්තාවක් අඹන්පොල රෝහලට හා තවත් කාන්තාවක් තුවාල ලබා ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව අඹන්පොල රෝහලට ඇතුලත් කල පිරිමි පුද්ගලයා හා කාන්තාව මියගොස් ඇත. රියදුරු සහ අනෙක් කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට මාරුකර යවා ඇත. අනතුරට පත් මොවුන් එකම පවුලේ සාමාජිකයින් වේ.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ අතර මරණකාරිය වයස අවුරුදු 53 ක් වූ කොච්චිවත්ත, වැලිවේරිය ප්‍රදේශයේ පදිංචි අඹුසැමි යුවළකි.**

මෘතශරීර කුරුණෑගල රෝහලේ මෘතශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**